(c) www.sinhalalyrics.com

මුගුරක් ඇවැසි තැන මුගුරක් ගෙන නැගෙනු
කඩුවක් ඇවැසි තැන කඩුවක් ගෙන කොටනු
සංග්‍රාමයට නවගුණ වැල ගෙන නොයනු
සංග්‍රාමයෙන් පසු නවගුණ වැල ගනිනු

කඩු දුනු හී තෝමර ඈ අවිගෙන
වියරු වැටී සතුරන් දිව එන කල
රණබිම වැද එරම්ණිය ගොතාගෙන
දසසිල් වී නවගුණ වැල ගනිමුද

කවුරුන් හෝ මගෙ රට බිලිදේ නම්
නොපනත්කම් හින්දා අවුරානම්
කුමටද උන් හා සීල සමාගම්
සටනින් තොර මුනිවත අවදානම්

පද රචනය - සුනිල් ආරියරත්න
සංගීතය - රෝහණ වීරසිංහ

(c) www.sinhalalyrics.com